ඔහේට ඒක තේරුම් ගන්න පුලුවන්නෙ...? මේකෙ ඉන්න පුලුවං එක ලොක්කයි.. හැමෝටම ඉදිමෙන්න දෙන්න බැහැ"

"මට තේරෙනවා සර්.."

"තමුසෙ කොහොම හරි විදුල මුණසිංහ එක්ක එකතු වෙනවා.. උගේ ෆිල්ම් එක අපට ගහන එකක් වුණත් මොන කෙහෙම්මලක් වුණත් කමක් නැහැ... ඒකට සල්ලි දානවා.. කොහොම හරි සාරානන්දයා කරන්න යන වැඩ පිළිවෙලින් විදුල අයින් කරගන්න ඕනෙ.. විදුල දක්ෂයා.. දක්ෂයෙන් මොන ආකාරයේ වැඩක් කළත් ඒක ඉහළ මට්ටමේ එකක් වෙනවමයි.. තමුසෙ කොහොම හරි විදුල සාරානන්දගෙ වැඩෙන් අයින් කරගන්නව.. මං ඉතුරු හරිය සාරානන්ද එක්ක බලාගන්නං.. තේරුණාද?"

ලොක්කාගේ කතාවේ අමුතුවෙන් තේරුම් ගන්නට දෙයක් නැත . සියල්ල එලෙසින්ම සිදුවිය යුතු බව හසන්ත දනියි.

දුරකතනය නාද වෙයි.

"සර්.. විදුල ලයින් එකේ.." සාවිත්‍රි කියයි.

0000000000000000

තානාපති කාර්යාලයේ කුඩා සිනමා ශාලාවේ සිටි පිරිස විස්සකට නොවැඩි යයි විදුල ඇස්තමේන්තු කළේය. කලකට පෙරදී මෙවන් උසස් විදේශ සිනමා පටයක් පෙන්වන විට මේ ශාලාව පිරී යන තරමින් පිරිස එක් රැස්වෙයි. ඒ පැමිණෙන බොහෝ අය සිනමාව පිළිබඳ උනන්දුවක් දක්වන තරුණ තරුණියන් විය. එහෙත් දැන් ඒ උනන්දුව ක්‍රමයෙන් හීන වී ගෙන යන බව පැහැදිළිවම පෙනෙයි. අද දකින්නට ඇත්තේ ද වෙනදා සැමතැනම දකින්නට ලැබෙන මුහුණු කීපය පමණකි.

විදුල ශාලාවට ඇතුල්වන තැන කතාවක නිරතව සිටි සුනන්ද විදුල දැක සිනාසුණෝ ය. කෙටි චිත්‍රපට කීපයක් කරමින් සිනමාව පිළිබඳ යම් හැදෑරීමක යෙදෙමින් සිටින තරුණ සිනමාකරුවා අසළ විදුල මොහොතකට නතරවුණෝ ය.

"සර් අද සෙනග නම් ටිකක් අඩුයි" සුනන්ද කීවේය.

"කලාත්මක සිනමාව කියන එක ගැන මිනිස්සුන්ගෙ උනන්දුව අඩුවේගන යනව වගෙයි.. " විදුල කීවේය.

"කලාත්මක සිනමාවේ පතාක යෝධයොත් ඇද වැටද්දි පුංචි මිනිස්සු ගැන මොන කතාද සර්" සුනන්ද කීවේ වියැකී ගිය සිනාවකින් යුතුවය.

විදුල සුනන්ද දෙස බැලුවේ ප්‍රශ්නාර්ථයක් රැඳුන දෑසිනි. "සුනන්ද අදහස් කළේ මොකක්ද?" ඔහු අනතුරුව ඇසුවේය.

තරුණයා පිළිතුරක් නොදුන්නේය. සමහරවිට තමාට කියන්නට ඇති දෙය නොකියා සිටින්නට ඔහු තීරණය කරන්නට ඇත. සුනන්ද වෙනුවට පිළිතුරක් දුන්නේ අසළ සිටි වෙනත් තරුණයෙකි. මෙයට පෙර සිනමා වැඩ සටහන් වලදී දැක ඇති ඔහුගේ නම සුනන්දට මතක නැත.

"සර්ල වගේ යමක් තේරෙන උදවියත් හොරිකඩ වැඩ කරනකොට කලාවක් රැකෙයිද සර්"

ප්‍රකාශය ඉතා සාහසිකය. එය විදුල සසළ කළේය. ඒ බව නොපෙන්වා සිටින්නට උත්සාහ කළද එය අසාර්ථක උත්සාහයක් බවට පත්වනු වැළැක්විය නොහැකි විය.

"මට තේරුණේ නැහැ ඔයා අදහස් කළ දේ" විදුල කීවේය.

"සටන් පාවා දුන්න හැම එකෙකුටම තේරෙන්නෙ නැහැ තමයි.. සල්ලියි බලයයි..." තරුණයා ආවේගශීලීව තව යමක් කී නමුත් කිසිවකු විසින් ඔහු ඉවතට ඇදගෙන යන ලදින් එය විදුලට පැහැදිළිව නෑසුණි. ඔහු සුනන්ද දෙස බැලුවේ අතරමං වූවකු ලෙසින්ය.

"සමහර අයට කේන්ති ගිහිල් ඉන්නෙ සර්.."

"මොකකටද..?"

"සර් ආණ්ඩු පුම්බන්න ෆිල්ම් එකක් හදනවා කියන එකට.. මේ මිනිස්සු සර්ට ආදරෙයි.. මේ නිව්ස් එක උන්ට දිරවගන්න බැරි ඒකයි.." සුනන්ද තමා අත වූ විකල්ප පුවත්පත විදුලට පෙන්වන අතර කීවේය. පුවත්පතේ සිනමා පිටුව පෙරළු ඔහු එය විදුලට කියවන්නට හැකිවන ලෙස අල්ලාගෙන සිටියේය.

"සම්මානලාභී අධ්‍යක්ෂවරයා රජයේ හොරණෑවක් වෙයි.. විදුල මුණසිංහ ගෙන් ආණ්ඩුව පුම්බන සිනමා පටයක්"

**මතු සම්බන්ධයි**

15 වන පිටෙන්

ප්‍රථම වගකීම වන්නේ වෑබැම්මේ උමං තිබේදැයි පරීක් ෂා කර බැලීමය.

මෙය එක් වරක් වෑ බැම්ම දිගේ එහාට මෙහාට ඇවිදීමෙන් නිමකළ හැකි ක්‍රියාවක් නොවේ. නිරන්තරයෙන් ඔහු වෑබැම්ම දිගේ එහාට මෙහාට සක්මන් කළ යුතුය. රෑ පානක නම් හුළුඅතු බැඳගෙන වැවේ වෑකන්දේ පෙරමුණ පරීක්ෂා කරමින් සක් මන් කළ යුතුය. යම් විදියකින් වැවේ උමඟක් ඇති වී වෑ බැම්ම කැඩී ගියොත් වැව භාරව සිටින මුලාදෑනියා ඊට වගකිවයුතුය. වරිග සභාවේ දඬුවම් ලැබිය යුතුය.

රාත්‍රියේ හෝ දවාලේ වෑ බැම්මේ ඇවිදින විට උමඟක් දුටුවහොත් ඒ වහාම ගමේ පිරිමි අය කැඳවා කමත්වලින් පිදුරු ගෙන්වා ගත යුතුය. පිටවානෙන් වැව්දිය අඩු කරනතුරු උමඟට පිදුරු කොටා රැකගත යුතුය. උමග පිහිටියේ හුඟක් දිය යට නම් ඒ උමඟ මකාගැනීම ඉතාමත් අමාරුය. ශක්තිමත් වැව හුරු තරුණයන් දෙතුන් දෙනකු වැවට බස්සවා උමඟ පිහිටි තැන සොයාගෙන ලොකුවට මිටි බඳින ලද පිදුරු කට්ට උමඟට කොටනු ලැබේ. මෙය ඉතාමත් බිහිසුණු සහ අවදානම් කාර්යයකි. සුළු ප්‍රමාදයක් හෝ අත්වැරැද්දක් සිදුවුවහොත් උමඟට පිදුරු කවමින් සිටින්නා ද උමඟ තුළින් ජල බලයෙන් ඇදගෙන යයි.

එසේ ජල සැඩ පහරේ වේගයට පිදුරු කවමින් සිටි තැනැත්තා උමඟ තුළට ඇදගෙන ගොස් වෑකන්දේ පසුමුණෙන් මතුවුවහොත් අමාරුවෙන් හෝ ඔහු බේරා ගත හැකිය. එසේ මතු නොවී උමඟ තුළ හිරවුවහොත් ඔහු උමඟ තුළම මියයයි. එවැනි අවස්ථාවක ගමේ කතාබහ කෙරෙන්නේ ගමේ අයගෙන් වැවට සිදු වූ අත්වැරැද්දකට දෙවියන් කෝපවී ජීවිතයක් බිලිගත් බවයි. මේ නිසා වැවක උමං වැසීම එදා ඉතාමත් අවදානම් සහ ජීවිතය පරදුවට තබන කාර්යයකි. නමුත් ගම වෙනුවෙන් සහ වැව වෙනුවෙන් එසේ ඉදිරිපත් වන්නට කැමැති තරුණයෝ ගමේ හිඟ නොවූහ. ඊට පාදක වූයේ වැව කැඩී ගියොත් වැවත් ඉවරයි වැව් ගම්මානයත් ඉවරයි යන ආකල්පය ගැමියන් තුළ තහවුරු වී තිබුණු හෙයිනි. එසේම මේ වැව අප රැක ගතයුතුය යන අපේකමින් පිරුණු චින්තනයෙන් ගමේ අය සන්නද්ධ වී සිටි නිසාය.

කෙසේ වුවද පැරණි වැව් සංස්කෘතියේ පැවැති පාරම්පරික කෙම්පහන් ඇතුළු ගුණාංග අදටත් පවත්වාගෙන යැමෙන් වැඩක් මිස අවැඩක් වන්නේ නැත. පැරණි වැව් ශිෂ්ටාචාරයේ පැවැති හැම ගුණාංගයක් තුළම ශුභවාදී අර්ථයක් ද ගැබ් වී තිබේ.







# What Money is worth

*Today Money seems to be everything*
*People usually think that if you have more it is a blessing*
*But what would happen if you had more than you need*
*Would you feed someone hungry and do a good deed*
*Travel around the world*
*Or go on that break that you have deserved*
*Would you buy our loved something new*
*Just as a way to say thankyou*
*Maybe even leave your mark*
*Because today a dollar can go far*

Money is probably an essential to survive today in our modern world. However much you have there will always be a want and desire for more, but what would you do with all this money? Most people would use it to support their family and buy them luxuries, while others may use their money to make someone's life a bit better. So I thought to myself what would I do if I had a large supply of money?

I always wanted to travel so if I had a lot of money I would most likely use a lot of it to travel. I would travel to countries that not much people have visited or have heard of. I always wanted to go somewhere that is tropical or has a rainforest so that I could learn about the different plants or animals that come in nearly every colour and shape. I have also always wanted to visit significant landmarks that you read about in books and learn about at school. You would learn so much more about the world by visiting different countries and learning about how other people live and experiencing lifestyle in a country which is completely different from yours.

It would be a lie to say that I would not use any of the money for luxurious that I want. People always want to improve their lives and make living a little more comfortable. It would be false to say that someone would not buy anything that they want if they earned a lot of money. That's why people work so hard, so that they can earn money to consume and make their lives better. How far they will go to buy high end comforts just depend on the person. I would only buy stuff that I really want and I would save the rest.

Because I would have a lot of money I would not spend it all but I would give some to people who really need. There is nothing better than knowing that by donating someone a small amount of money you could make their day, even month better. I would not just give my money to people living here in Australia but I also would donate some of it to people who are living in extreme poverty and would use every cent wisely. Why would you just waste your money on products that you already have when you can donate it to people who would use it to feed their family. As well as donating money to individuals you could also donate some to funds or campaigns that are aimed at making the world better. By donating money to these organisations you know thatyou are potentially being a big part of making the world a better place. You could be using your money to help save millions of lives our save our planet. Whether you are donating a large amount of money to a charity or sponsoring a child it always good to know that you have given back.

The last thing I would probably use my money for is to benefit my family and close friends. To thank them for what they have done for me. Although money will never be enough to thank them for all they have done it is a good place to start.

Money is what makes our work so what you do if you had more than enough money? Just remember that you can do what you have always dreamed of, make someone's world happier or help a charity that helps the world that we have already taken a lot from. Today a little goes a long way it just depends on where you want to go with what you have in your pocket.